Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 3 - 1 (ඇ) ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන (SLIATE) මගින් පිරිනමන ලද උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (පූර්ණ කාලීන/අර්ධ කාලීන) පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කර ඇති වයඹ පළාතේ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සේවා අවශ්‍යතාවය හා පවතින ප්‍රතිපාදන මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

02. යෝග්‍යතාවය :

2.1 *සාමාන්‍ය සුදුසුකම්.-*

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය.
IV. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනකට (03) නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
(ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)
V. සෑම අපේක්ෂකයකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
VI. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2018.12.31 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

2.2 *අධ්‍යාපන සුදුසුකම්.-*

පහත (1) (2) හා (3) හි සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(1) උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් පිරිනමන ලද උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (පූර්ණ කාලීන/අර්ධ කාලීන) සහතිකයක් ලබා තිබිය යුතුය.

(2) පහත සඳහන් I, II, III හි දැක්වෙන සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතුය.

I. ඉංග්‍රීසි විෂය ඇතුලුව එක් වරකදී අ.පො.ස. (උ.පෙළ) විෂයයන් තුනක් (03) සඳහා සාමාර්ථ ලබා තිබීම,

*හෝ*

II. අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එක්වරකදී විෂයයන් තුනක් (03) සඳහා සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හා ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම,

*හෝ*

III. අ.පො.ස. (උ.පෙළ ) විභාගයේදී එක්වරකදී විෂයයන් තුනක් (03) සඳහා සාමාර්ථ ලබා තිබීම සහ අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයයට විශිෂ්ට සාමාර්ථයක් ලබා තිබීම.

(3) අ.පො.ස. (සා.පෙළ ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය විෂයයන් සමත්ව තිබිය යුතුය.

*සැලකිය යුතුයි :*

(අ) උසස් පෙළ නව විෂය නිර්දේශයන්හි පොදු ඉංග්‍රීසි හා පොදු ප්‍රශ්න පත්‍රය උසස් පෙළ විෂයයක් ලෙස සලකනු නොලැබේ.
(ආ) සියලු ඩිප්ලෝමාධාරීන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වලංගු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබිය යුතුය.

03. *සේවා කොන්දේසි.-*

රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද වයඹ පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධන වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (ඇ) ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.1 *වැටුප් ක්‍රමය.-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි GE 1 - 2016 අනුව රු. 27,740 - 6 x 300 - 7 x 380 - 2 x 445 -රු. 33,090/= වේ. (2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

3.2 මෙම පත්වීම ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම් ලාභීන් යටත් වේ.

3.3 වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව උසස්වීම් සිදු කරනු ලැබේ.

3.4 මුල් පත්වීම් ලබන දිස්ත්‍රික්කයේ අවම වශයෙන් වසර හයක (06) කාලයක් සේවය කළ යුතුය. එසේම තම මුල් පත්වීම ලබන පාසල අතිදුෂ්කර/ දුෂ්කර පාසලක් නොවන කල්හී තම සේවා කාලය තුල ඕනෑම අවස්ථාවකදී අවම වශයෙන් වසර 5 ක කාලයක් අතිදුෂ්කර / දුෂ්කර පාසලක සේවය කිරීමට බැඳී සිටී.

3.5 2014.01.21 දිනැති රා.ප.ච. 01/2014 හා එයට වරින්වර සිදුකරන සංශෝධනයන්ට අනුව සේවයට පත්වී වසර පහක (05) කාලයක් ඇතුලත තනතුරට නියමකර ඇති දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

3.6 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධාන වලට යටත් වේ.

04. *බඳවා ගැනීම.-*

4.1 *බඳවා ගැනීමේ ක්‍රමය.-*

I. වයඹ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා විෂය ගුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන්ගෙන් බඳවා ගනු ලැබේ.

II. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි විෂයය පුරප්පාඩු සඳහා එම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ගෙන් ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි විෂයය පුරප්පාඩු සඳහා එම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ගෙන් ද දිස්ත්‍රික් පදනම මත බඳවා ගනු ලැබේ.

III. තෝරාගැනීම් සඳහා ලිඛිත තරග විභාගයක් පැවැත්වේ. ලිඛිත තරග විභාගයෙන් සමත් වුවන් විෂය පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමුකර ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ. එසේ වුව ද එක් දිස්ත්‍රික්කයක පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් ලැබූවන් නොමැති අවස්ථාවක අනෙක් දිස්ත්‍රික්කයේ සුදුසුකම් ලැබුවන්ගේ ප්‍රමුඛතා ලේඛනයෙන් තෝරාගනු ලැබේ.

4.2 *ලිඛිත තරග විභාගය.-*

මෙම විභාගය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතුය.

| *විෂය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |

*විෂය නිර්දේශය :*

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීමේ අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

අපේක්ෂකයාගේ සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳ වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වේ.

(එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි)

4.3 *සම්මුඛ පරීක්ෂණය*

මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා සහ අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම පිණිස මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම. (ලකුණු 10)

| *අනු. අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත්වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම | 05 |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතික එකක් හෝ කිහිපයක් ලබා තිබීම | 05 |
| | මුළු ලකුණු | 10 |

4.4 *ප්‍රායෝගික පරීක්ෂණය- (ලකුණු 15)*

ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවය සහ සන්නිවේදන කුසලතාවය පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම්කරු විසින් හඳුනාගන්නා මාතෘකාවක් යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් විනාඩි දහයකට (10) නොවැඩි කාලයක් තුළ ඉදිරිපත් කිරීමක් කළ යුතුය.

05. *විභාග මධ්‍යස්ථානය.-*

මෙම තරග විභාගය පහත දැක්වෙන නගරවලදී පවත්වනු ලැබේ. තමන් පදිංචි දිස්ත්‍රික්කය අනුව නගරය තෝරා ගත යුතුය.

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | 1 |
| පුත්තලම | පුත්තලම | 2 |

06. *තෝරා ගැනීමේ ක්‍රමය.-*

(අ) එක් එක් දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම් කළ, එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි අයදුම්කරුවන් අතරින් ලිඛිත තරග විභාගයේ විෂයයන් දෙකම සමත් වූවන්ගේ ලකුණු කුසලතාවේ අනුපිළිවෙළින් ඒ ඒ දිස්ත්‍රික්කයේ ඉංග්‍රීසි විෂය පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ආ) එම සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ලිඛිත විභාගයේ හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළින් ඉංග්‍රීසි විෂය පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ඇ) ලිඛිත විභාගයෙන්, සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණුවල එකතුවේ කුසලතාවය අනුව ඒ ඒ දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතා ලැයිස්තු සකස්කර ඉහළම සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

(ඈ) එක් දිස්ත්‍රික්කයකින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් තෝරාගෙන අවසන් වුවද, තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් අනෙක් දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතා ලැයිස්තුවෙන් තෝරාගනු ලැබේ.

07. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු වශයෙන් රු.600/- ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය.

08. *අයැදුම් කළ යුතු ක්‍රමය.-*

I. A4 (සෙ.මී. 21x29) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම් පත්‍රය සකස් කර ඉදිරිපත් කළ යුතුය.

II. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හෝ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

III. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 32,960/= කට වැඩි ආරම්භක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/ පළාත් සභා රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.1 *ඉල්ලුම්පත් යොමු කිරීම.-*

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.12.31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහල කෙළවරේ පැහැදිලිව "වයඹ පළාත් සභා ගුරු සේවයට ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2018 " සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

8.2 මෙම නිවේදනයේ දක්වා ඇති ආකෘතියට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

09. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-*

අපේක්ෂකයින් තමා විභාගයට පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලියවිලිවලින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

*හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සටහන* : විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

10. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

11. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) නිවේදනයක් මගින් පළකරනු ඇත. විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 3 කට පෙර විභාග ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය.

I. විභාගයේ නම :..........................................
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම :..........................................
III. ලිපිනය :..........................................
IV. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................
V. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ කාර්යාලය, ලියාපදිංචි අංකය හා යැවූ දිනය :..........................................

12. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

13. මෙම විභාගය පැවැත්වීම, කල්දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණයද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 නොවැම්බර් මස 08 වැනි දින,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018**

01. ස්ථිර පදිංචිය :

| | |
|---|---|
| *පදිංචි දිස්ත්‍රික්කය* | |
| *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය* | *ඉංග්‍රීසි* |

*නගර අංකය :* [    ]

02. 2.1 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................................
.......................................................................................................... මයා/මිය/මෙනවිය

2.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs. ..............................................................
..........................................................................................................

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................................
.......................................................................................................... මයා/මිය/මෙනවිය

2.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs. ..............................................................
..........................................................................................................

2.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. 3.1 ස්ථිර පදිංචි ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..............................................................................................................

..............................................................................................................

3.2 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................................................

..............................................................................................................

3.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..............................................................................................................

..............................................................................................................

3.4 දුරකථන අංකය : ජංගම : ................................................

නිවස : ................................................

04. 4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී : - F පුරුෂ - M
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

4.2 උපන් දිනය :- වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

4.3 2018.12.31 දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

4.4 විවාහක/ අවිවාහක බව : | | විවාහක - 1 අවිවාහක - 2

05 5.1 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ...........................................................................

5.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- ...........................................................

5.3 2018.12.31 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :- අවුරුදු :............. මාස :............. දින :............

06. *අධ්‍යාපන සුදුසුකම්.-*

6.1 *අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර.-*

පළමුවර - වර්ෂය හා මාසය : ...................... විභාග අංකය : .......................

දෙවනවර - වර්ෂය හා මාසය : ..................... විභාග අංකය : .......................

| | *විෂයය* | *පළමුවර සාමාර්ථය* | *දෙවනවර සාමාර්ථය* | | *විෂයය* | *පළමුවර සාමාර්ථය* | *දෙවනවර සාමාර්ථය* |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | 06 | | | |
| 02 | | | | 07 | | | |
| 03 | | | | 08 | | | |
| 04 | | | | 09 | | | |
| 05 | | | | 10 | | | |

6.2 *අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයේ වර්ෂය හා මාසය :- .............................................

විභාග අංකය :- .............................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

6.3 *උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර.-*

6.3.1 ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව (පූර්ණ කාලීන/ අර්ධකාලීන) - විස්තර සඳහන් කරන්න :............................................................

.................................................................................................................................................................................................................

6.3.2 පාඨමාලාව හදාරා ඇති අධ්‍යාපන ආයතනය :..................................................................................................

6.3.3 හදාරන ලද කාලසීමාව :..................................................................................................................

6.3.4 ඩිප්ලෝමාව වලංගු වන දිනය : ..........................................................................................................

07. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

7.1 ලදුපත් අංකය : ...................................................... මුදල : ..........................................
දිනය : ...............................................
නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : .......................................................

| ලදුපත මෙහි අලවන්න. |
|---|

08. *අයදුම්කරුගේ සහතිකය :*

....................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි අනාවරණය වුවහොත් වයඹ පළාත් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (ඇ) ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය : ..............................

..........................................,
අයදුම්කරුගේ අත්සන

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .......................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය : .......................................................................
සහතික කරන අයගේ නම : .......................................................................
අත්සන : .......................................................................
තනතුර හා නිල මුද්‍රාව : .......................................................................

(මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 32,960/= කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)